# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/15/System/2/Manual | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2025.04.11 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂවරුන්

**<u>පරිගණක පද්ධතිය හරහා ගිණුම් කටයුතු පවත්වා ගෙන යෑම හා අත්පොත් ගිණුම් සටහන් (Manual) කටයුතු අත්හැරීම 2025.05.31 දිනට පෙර අවසන් කිරීම.</u>**

සමෘද්ධි බැංකුවල අත්පොත් ගිණුම් සටහන් අත් හැරීම සම්බන්ධයෙන් මවිසින් ඔබ වෙත යොමු කර ඇති DSD/HO/05/MF/15/Manual හා 2025.04.08 දිනැති ලිපිය හා බැදේ.

2024.01.10 දින පැවැති පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේදි ( COPA ) ලබාදුන් උපදෙස් හා නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා උක්ත ලිපියෙන් ඔබ වෙත උපදෙස් ලබාදි ඇති නමුත් 2025.04.08 දින වන විට සමෘද්ධි බැංකුවල අත්පොත් සටහන් ලිවීමේ (Manual ) අත්හැරීම සිදුකළ බැංකු සංඛ්‍යාව 291 පමණි. (එය 26% ක ප්‍රගතියකි)

02. දිවයිනපුරා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1097 ක්‍රියාත්මක වන අතර 2025.04.08 දිනය වන විට Manual ඉවත් කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ලැබී ඇති අයදුම් පත්‍ර සංඛ්‍යාව 521 ක් වැනි අඩු සංඛ්‍යාවක් වේ. මෙම ප්‍රගතිය ඉතා දුර්වල බැවින් **<u>සමෘද්ධි බැංකුවල දෛනික අත්පොත් ලිවීමේ ( Manual) ගිණුම් කටයුතු අත්හැරීම ප්‍රමුඛ හා අත්‍යාවශ්‍ය කටයුත්තක් සේ සලකා කටයුතු කිරීමට සමෘද්ධි බැංකු කළමණාකරුවන්ට</u>** උපදෙස් ලබාදීමට පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.
ඔබ දිස්ත්‍රික්කයේ manual අත්හැරීම සම්බන්ධයෙන් ලබා ගෙන ඇති ප්‍රගතිය ඇමුණුම අංක 01 හි දක්වා ඇත. ඒ අනුව manual අත්හැරීම සිදුකර නොමැති බැංකු සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03.ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් බැංකු මට්ටමින් ක්ෂේත්‍ර නිරික්ෂණය කිරීමෙන් පසු අසම්පූර්ණව පැවැති නිර්නායක සම්පූර්ණ කිරීමට පැවැරුම් ලබාදී ඇති බැංකු විසින් එකී පැවැරුම් සම්පූර්ණ කර දිස්ත්‍රික් කමිටු නිර්දේශය සමග අදාල අයදුම් පත්‍ර 2025.04.25 දිනට පෙර ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවීමට පියවර ගත යුතුය. (දිස්ත්‍රික්කයට අදාල බැංකු නාම ලේඛනය ඇමුණූ 02 හි සඳහන් වේ)

04 . ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් මෙතෙක් ක්ෂේත්‍ර නිරික්ෂණ කටයුතු සිදුකර නොමැති බැංකු නිරික්ෂණ කිරීමට කඩිනම් වැඩසටහනක් සකස් කර ඇති අතර එම කටයුතු 2025.04.25 දිනෙන් පසු ක්‍රියාත්මක කර manual අත්හැරීමේ ලිපි නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

05. 2022/14 චක්‍රලේඛණ උපදෙස් අනුව අත්පොත් ගිණුම් සටහන් තැබීම් (manual daily works ) ගිණුම් කටයුතු අත්හැරීමට බාධාවන් ලෙස හඳුනා ගෙන ඇති බැංකු සංඛ්‍යාව හා අදාල නාම ලේඛනය ඇමුණුම 03 පරිදි සකස් කර 2025.04.25 දිනට පෙර අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය )වෙත microfinanceall2021@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමට දිස්ත්‍රික් ක්ෂුද්‍ර මූල්‍ය විෂයභාර කළමණාකරුවන්ට උපදෙස් ලබා දෙන මෙන් වැඩිදුරටත් දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්
1. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.
2. සහකාර අධ්‍යක්ෂ ( තොරතුරු තාක්ෂණ) - දැ.ගැ.ස.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |